# (එ) මිල සහ වැටුප්

## 1. මිල

### (අ) කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය ආර්ථිකයේ මිල මට්ටම්වල විචලනයන් මිණීමේදී ඒ සඳහා ලබාගත හැකි එකම දර්ශක අංකය ලෙස පවතී. 1973 වසර සඳහා වූ වාර්ෂික වාර්තාවේ, එකී අඩු ලුහුඬුතාවයන් සවිස්තරව දක්වා ඇත. එහි අඩු ලුහුඬුතාවයන් නිසා කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය ආර්ථිකය තුල ඇතිවන නියම මිල වැඩිවීම් ඌණ ලෙස තක්සේරු කරන බව අදහස් වේ. කෙසේ වුවද 1974 වසරේ දක්නට වූ උද්ධමන පීඩන වේගයට අවධානය යොමු කිරීමට මෙම ඌණ තක්සේරු කිරීම් පවා ප්‍රමාණවත් වේ.

1973 වර්ෂයට වඩා 1974 වර්ෂයේ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සියයට 12·3 කින් වැඩි වූ අතර, 1972 ට වඩා 1973 දී මේ වැඩිවීම සියයට 9·7 ක් විය. (II (එ) 1 සංඛ්‍යා සටහන බලන්න.) 1960-70 අවුරුදුවල දර්ශක අංකයන්ගේ වැඩිවීමේ සාමාන්‍ය වාර්ෂික අනුපාතය දළ වශයෙන් සියයට 3·3 කි. 1970 පමණ සිට දර්ශකයේ තුලනාත්මක වැඩිවීම් මගින් පෙන්නුම් කෙරෙන්නේ මෑත කාලයේදී උද්ධමන පීඩනයන් සීඝ්‍රයෙන් ක්‍රියාකාරී වී තිබෙන බවය.

සැලකිය යුතු මිල ඉහළ යාම් සිදුවූ ක්ෂෙත්‍රයන් හඳුනා ගැනීමට කොළඹ පාරිභෝගික-යන්ගේ මිල දර්ශකයේ භාණ්ඩ අනුව කරන වර්ගීකරණය ආධාර වෙයි. භාණ්ඩ දර්ශක අංකයන්හි දිටිය හැකි සැලකිය යුතු ලක්ෂණය වන්නේ දිගින් දිගටම ආහාර දර්ශකය ඉහළ මට්ටමක පැවතීමය. 1973 වර්ෂයේ සියයට 11·7 ක වැඩිවීමක් හා සැසඳීමේදී, දර්ශකයට ඇතුලත් ආහාර ද්‍රව්‍යයන්ගේ 1974 වර්ෂයේ මිල වැඩිවීම සියයට 15·1 ක් විය. වටිනාකම් අනුව, සමස්ත දර්ශකයේ ඇතුලත් ශීර්ෂයන්ගෙන් සියයට 62 ක් පමණ ආහාර ගණයට අඩංගු වීම නිසා, සමස්ත ජීවන වියදම් දර්ශකය කෙරේ, ආහාර දර්ශකයේ වෙනස්වීම්වලින් ඇති වන බලපෑම සැලකිය යුතු එකක් වේ. රෙදිපිළි, ඉන්ධන හා එළිය සඳහා වන මිලයන් ද ඒ හා සමාන ඉහළ මට්ටමක පැවැති බව II (එ) 1 වැනි සංඛ්‍යා සටහන දක්වයි. එබැවින්, රෙදිපිළි සඳහා වන දර්ශකයේ මිල වැඩිවීම, 1973 වර්ෂයේදී සියයට 14·0 ක් ලෙස ද 1974 වර්ෂයේදී සියයට 9·9 ක් ලෙසද පෙන්නුම් කෙරුනි. ඉන්ධන හා එළිය සලකන කල්හි, තත්ත්වය තවත් උග්‍ර වී ඇති බැව් පෙනේ. 1973 සියයට 12·7 ක් වූ ඉන්ධන මිල නැගීම, 1974 දී සියයට 34·4 ක් වීමෙන් දර්ශකයේ ඉහළ නැගීම කෙතරම් දැයි පැහැදිලිව පෙනේ.

1974 වර්ෂය තුල ඇතැම් ප්‍රධාන ආහාර ද්‍රව්‍ය සම්භරක විශාල ලෙස මිල වෙනස් වීම් දක්නට විය. 1974 ජූලි මාසයේ සහතික වී නිපැයුම් මිල ඉහළ දැමීමත් සමගම සලාක සහල් රාත්තලක මිල රුපියල් 1·15 සිට රුපියල් 1·25 දක්වා වැඩි කරන ලදී. 1974 අගෝස්තු මාසයේදී නව ප්‍රාදේශීය සලාක ක්‍රමයක් හඳුන්වා දෙමින් සලාක සහල් මිල රුපියල් 1·10 දක්වා පහත හෙලනු ලැබීය. 1974 අගෝස්තු මාසයේදී තිරිඟු පිටි රාත්තලක මිල ශත 0·70 සිට රුපියල් 1·10 දක්වා වැඩි කළ අතර එය දළ වශයෙන් සියයට 57 ක වැඩිවීමක් විය. 1973 හඳුන්වා දුන් රාත්තල් 1 පිටි සලාකය 1974 අප්‍රේල් මාසයේදී රාත්තල් ½ දක්වා අඩු කැරුණි. පිටි වෙළෙඳ පොලෙහි වර්ධනයන් පාන් සැපයීම කෙරේ බලපෑ අතර, 1974 අගෝස්තු මාසයේදී පාන් රාත්තලක මිල ශත 0·98 දක්වා වැඩි වීමෙන් සියයට 35 ක පමණ වැඩිවීමක් පෙන්විය. 1974 මාර්තු මාසයේදී ලෝක වෙළෙඳ පොලෙහි මිල වැඩිවීමත් සමගම, සීනි රාත්තලක මිල රුපියල් 5·00 දක්වා වැඩිවීමෙන්, එය පළමු පැවැති මිලට වඩා සියයට 150 කින් වැඩිවුනි. 1974 ඔක්තෝබර් මාසයේදී සීනි රාත්තලක මිල රුපියල් 7·50 දක්වා වැඩිවීම නිසා එය තව දුරටත් සියයට 50 කින් වැඩි විය.

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ ආංශික වර්ගීකරණය මගින් මිල මට්ටම්වල තවත් මිම්මක් පෙන්නුම් කරයි. මෙහිදී දේශීය ගණය ආයාත ගණය, හා නිර්යාත ගණය ලෙස භාණ්ඩ වර්ග කර තිබේ. මෙම වර්ගීකරණයේ මූලික අදහස වන්නේ රටේ සාමාන්‍ය මිල මට්ටම කෙරේ මෙම ගණයන් එකිනෙකෙහි සාපේක්ෂ බලපෑම පෙන්නුම් කිරීමයි. ආනයන ගණය, ඉන්ධන, රෙදිපිළි සහ ප්‍රධාන ආහාර ද්‍රව්‍ය ආදියෙන් යුක්තයි. එබැවින්, සමස්ත දර්ශකයේ ආනයන ගණය සඳහා වන බර තැබුම සම්පූර්ණයෙන් සැහෙයි. ආයාත කරන ලද භාණ්ඩ තුලින් අන්තර් ජාතික උද්ධමනකාරී පීඩනයන් සැහෙන ප්‍රමාණයකින් දේශීය මිල මට්ටම කෙරේ සැහෙන බලපෑම් සිදුකරන බව එයින් පැහැදිලිය. උදාහරණයක් ලෙස 1973 දී සියයට 19 4 ක්වූ ආනයන ගණයේ මිල වැඩිවීමේ වේගය, 1974 දී සියයට 20·4 ක් වී තිබීම දැක්විය හැක. (II (එ) 1 සංඛ්‍යා සටහන බලන්න.) එසේ වී නමුත්, ඉතා වැදගත් මිල ඉහළයාමේ වේගයන් ආනයන ගණය වෙනවෙන් වාර්තා වී ඇතත්, සමස්ත දර්ශකයේ මෙම ගණයට අදළ බර තැබුම සාපේක්ෂ වශයෙන් පහත්ය.

## II (එ) 1 සංඛ්‍යා සටහන

### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය
(පාදය 1952 = 100)

| වර්ෂය | සියළුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර | රෙදිපිළි | ඉන්ධන හා එළිය | ගෙවල් කුලී | විවිධ | දේශීය ගණය | ආනයන ගණය | අපනයන ගණය |
| බරතැබුම | 100·0 | 61·9 | 9·4 | 4·3 | 5·7 | 18·7 | 60·0 | 35·0 | 5·0 |
| 1970 සාමාන්‍යය | 138·2 | 136·6 | 137 3 | 136·1 | 109·8 | 153·2 | 142·9 | 129·3 | 157·3 |
| 1971 සාමාන්‍යය | 141·9 | 139·1 | 145·0 | 140·8 | 109·8 | 159·5 | 148·9 | 129·7 | 157·9 |
| 1972 සාමාන්‍යය | 150·8 | 147·5 | 163·4 | 145·9 | 109·8 | 169·4 | 161·6 | 136·1 | 140·6 |
| **1973 සාමාන්‍යය** | 165·4 | 164·8 | 186·1 | 164·4 | 109·8 | 170·0 | 167·8 | 162·5 | 171·9 |
| 1 වන කාර්තුව | 157·7 | 155·5 | 181·6 | 155·4 | 109·8 | 168·7 | 164·6 | 148·3 | 159·0 |
| 2 වන කාර්තුව | 161·4 | 160·7 | 181·6 | 155·4 | 109·8 | 170·4 | 165·8 | 154·6 | 170·4 |
| 3 වන කාර්තුව | 167·8 | 169·3 | 188·7 | 167 5 | 109·8 | 170·4 | 169·8 | 166 1 | 171·6 |
| 4 වන කාර්තුව | 174·8 | 179·3 | 192·3 | 179·2 | 109·8 | 169·8 | 171·2 | 181·2 | 186·6 |
| **1974 සාමාන්‍යය** | 185·8 | 189·7 | 204·6 | 221·0 | 109·8 | 178·3 | 176·1 | 195·7 | 251·4 |
| 1 වන කාර්තුව | 178·3 | 181·1 | 192·3 | 216·4 | 109·8 | 174·2 | 171·2 | 184·8 | 236·5 |
| 2 වන කාර්තුව | 182·7 | 184·2 | 208·7 | 221·0 | 109·8 | 178·4 | 176·0 | 187·7 | 249·6 |
| 3 වන කාර්තුව | 188·6 | 193·2 | 208·7 | 221·0 | 109·8 | 180·0 | 177·0 | 201·4 | 259·8 |
| 4 වන කාර්තුව | 193·4 | 200·4 | 208·7 | 225·4 | 109·8 | 180·5 | 180·4 | 208·8 | 259·8 |
| ප්‍රතිශත වෙනස | | | | | | | | | |
| 1972 ට වඩා 1973 | 9·7 | 11·7 | 14·0 | 12·7 | 0·0 | 0·3 | 3·8 | 19·4 | 22·3 |
| 1973 ට වඩා 1974 | 12·3 | 15·1 | 9·9 | 34·4 | 0·0 | 4·9 | 4·9 | 20·4 | 46·2 |

මූලය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
හා ශ්‍රී ලංකා මහ බැංකුව

II (එ) 2 සංඛ්‍යා සටහනේ කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ අවුරුද්ද මුළුල්ලේම මිළ ගණන් වෙනස්වීම්වලට භාජනය වූ භාණ්ඩ පෙන්නුම් කරයි. අවුරුද්ද මුළුල්ලේම සිදු වූ මිළ වැඩිවීම්වලින් බොහොමයක්ම ඇතිවී ඇත්තේ ආහාර ගණය තුළය. කුළු බඩු ගම්මිරිස්, අබ, සියඹලා, උළුහාල්, අලුත්මාලු, කරවල, පොල්, පොල් තෙල්, එළවලු, බිත්තර, දෙහි, ජෑම්, මස්, කොත්තමල්ලි, කිරි සහ උකු කළ කිරි යනාදිය, විවිධ මාංසයන් තුළ ආහාර දර්ශකයේ වැඩිවීමට දයක වූ ශීර්ෂයන් සමහරකි. ශීර්ෂයන් සමහරක මිළ ගණන් යම් යම් අවස්ථාවන්හි විචලනය වූ බව පෙන්නුම් කෙරුණද, අනෙකුත් ද්‍රව්‍යයන්ගේ මිළ වැඩිවීම්, සමහර ද්‍රව්‍යයන්ගේ මිළ අඩුවීම් හේතුවෙන් එකී වෙනස සමනය කිරීමට ප්‍රමාණවත් නොවූ හෙයින්, සමස්තයක් වශයෙන්, වර්ෂය තුලදී ආහාර දර්ශකය ක්‍රම ක්‍රමයෙන් ඉහළ නගින ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරුණි. බනිජ තෙල් නිෂ්පාදනවල මිළ ඉහළ නැංවීම ද මිළ කෙරේ සැලකිය යුතු අන්දමින් බලපෑය. තෙල් මිළ වැඩි කිරීමෙන් පසුව, ඉන්ධන හා එළිය දර්ශකය 1974 ජනවාරි සහ පෙබරවාරි මාසවල තියුණු ලෙස වැඩි වූ අතර, ඉන් අනතුරුව එය ඉහළ මට්ටමක ස්ථිතිකව පැවතුණි. පළමුව, ඉන්ධනවල වැඩි වූ පිරිවැය තත්ත්වයන් හා එකහතාවයක් පවත්වා ගැනීම සඳහා පෙබරවාරි මාසයේදී දුම්රිය හා බස් ගාස්තු වැඩි කරන ලදී. තෙල් මිළ වැඩිවීමේ "ද්විතියික බල පෑම" දක්නට වූයේ ඉන් අනතුරුවය. වැඩි වූ ඉන්ධන වියදම් පියවා ගැනීමට විශේෂයෙන් රෙදි පිළි හා ආහාර ද්‍රව්‍ය බොහොමයකම මිළ ගණන් වැඩි කිරීමට සිදු විය.

## II (එ) 2 සංඛ්‍යා සටහන

## ජීවන වියදම් දර්ශකයේ ඇතුලත් ශීර්ෂයන්ගේ මාසික මිල වෙනස්වීම්

| මාසය | මිල වැඩිවීම | | මිල අඩුවීම | |
|---|---|---|---|---|
| | ගණය | ශීර්ෂයන් | ගණය | ශීර්ෂයන් |
| 1974, ජනවාරි | ඉන්ධන හා එළිය<br>ආහාර | භූමිතෙල්<br>ගම්මිරිස්, අබ, කුළු බඩු, සියඹලා, උළුහාල්, විස්කෝතු, මාළු, පොල්, පපඩම්, සහ පලා වර්ග | ආහාර | තේ කුඩු, සුදුළූනු, දෙහි, වාරයේ සහ අවාරයේ එලවලු |
| 1974, පෙබරවාරි | ආහාර | තේ කුඩු, ජෑම්, විස්කෝතු, පොල් සහ පපඩම් | ආහාර | ගම්මිරිස්, සුදුළූනු, කුළු බඩු, උළුහාල්, සියඹලා, දෙහි, වාරයේ හා අවාරයේ එළවළු හා පලාවර්ග |
| | ඉන්ධන හා එළිය<br>විවිධ | භූමිතෙල්<br>බස් ගාස්තු, දුම්රිය ගාස්තු, ටයර් සහ ටියුබ් | —<br>— | —<br>— |
| 1974, මාර්තු | ආහාර<br>විවිධ | තේ කුඩු, අවාරයේ එළවළු, විස්කෝතු, මාළු හා බිත්තර<br>සමහර වර්ගයේ සබන් සහ පුවත්පත් | ආහාර<br>— | කුළු බඩු, උළුහාල්, සියඹලා, පලාවර්ග, සහ වාරයේ එළවළු<br>— |
| 1974, අප්‍රේල් | ආහාර | තේ-බී.ඕ.පී., කුළු බඩු, උළු හාල්, දෙහි, අබ, අවාරයේ එළවළු, ජෑම්, විස්කෝතු හා පපඩම් | ආහාර | සියඹලා හා පලාවර්ග |
| | රෙදිපිළි | කමිස රෙදි, ඇඳුම් කට්ටල, රෙදි, සාරොන්, වේට්ටි, සාරි, මල් චීත්තරෙදි, සුදුරෙදි, බැනියන්, තුවා හා ගෘහරෙදි | රෙදිපිළි | පට රෙදි |
| 1974, මැයි | ආහාර | තේ-බී.ඕ.පී., විනාකිරි, සියඹලා, පලා වර්ග, හා වාරයේ එළවළු, පොල්තෙල්, ජෑම්, ළූණු | ආහාර | කුළු බඩු, අවාරයේ එළවළු සහ පපඩම් |
| 1974, ජූනි | ආහාර | කුළු බඩු, උළු හාල්, පොල් තෙල්, එළවළු හා විස්කෝතු | ආහාර | දෙහි සහ පපඩම් |
| 1974, ජූලි | ආහාර<br>විවිධ | කුළු බඩු, උළුහාල්, සියඹලා, පලාවර්ග, ජෑම්, කරවල<br>පපඩම්, බිත්තර, විස්කෝතු, මත්පැන් | ආහාර<br>— | වාරයේ හා අවාරයේ එළවළු<br>— |
| 1974, අගෝස්තු | ආහාර | කිරිපිටි, පාන්, අබ, හා ජෑම් | ආහාර | සියඹලා, දෙහි, සුදුළූනු, එළවළු, අල වර්ග, පපඩම් |
| 1974, සැප්තැම්බර් | ආහාර | අලුත් කිරි, උකුකල කිරි, කොත්තමල්ලි, අබ හා සියඹලා | ආහාර | පපඩම් හා බිත්තර |
| 1974, ඔක්තෝබර් | ඉන්ධන හා එළිය<br>ආහාර | ගිනිපෙට්ටි<br>අලුත් කිරි, උකු කල කිරි, විස්කෝතු, පපඩම්, බිත්තර, සියඹලා පලාවර්ග හා වාරයේ එළවළු | —<br>ආහාර | —<br>අබ |
| 1974, නොවැම්බර් | ආහාර | කොත්තමල්ලි, අබ, දෙහි, රතුලූනු, බිත්තර, අර්තාපල්, පලා වර්ග හා වාරයේ එළවළු | ආහාර | අල වර්ග, විස්කෝතු හා අවාරයේ එළවළු |
| 1974, දෙසැම්බර් | ආහාර<br>විවිධ | විනාකිරි, බටර්, අලුත් මාලු, පලාවර්ග හා වාරයේ එළවළු<br>මත්පැන් හා අභ්‍යාස පොත් | ආහාර<br>— | අබ, කුළුබඩු, බිත්තර සහ අවාරයේ එළවළු<br>— |

1973 අවසාන කාර්තුවේ සහ 1974 මුල් භාගයේ ලෝක වෙළෙඳ පොලේ අමු තෙල්වල මිළ තියුණු ලෙස ඉහළ යාමේ හේතුවෙන් 1974 ජනවාරි මසදී ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් නිෂ්පාදිතයන්ගේ සිල්ලර මිළ ගණන් පෙර නොවූවිරූ පරිදි ඉහළ දැම්මට සිදුවිය. දේශීය ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගේ මිළ ගණන්වල වෙනස්වීම් II (එ) 3 සංඛ්‍යා සටහනින් දැක්වේ.

## II (එ) 3 සංඛ්‍යා සටහන

## ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිළ වෙනස්වීම්

| නිෂ්පාදිතය | 1972 අවසානයේ මිළ | 73. 8. 24 දින කල මිළ වැඩිවීම | 1974 ජනවාරිවල මිළ වැඩිවීම | |
|---|---|---|---|---|
| | | | ජනවාරි 9 දින | ජනවාරි 10 දින |
| 1· භූමි තෙල් .. | 1·32 | 1 92 | — | 3·60 |
| 2· පැට්‍රල් – සුපිරි .. | 5·75 | 6·55 | 12·50 | — |
| 3 පැට්‍රල් – සාමාන්‍ය .. | 5·30 | 6·10 | 12·00 | — |
| 4· බර ඩීසල් .. | 1·53 | 2·13 | — | 4·60 |
| 5· කාර්මික ඩීසල් .. | 1·63 | 2·23 | — | 4·90 |
| 6· ඔටෝමැටික් ඩීසල් ., | 2·14 | 2·74 | — | 4·80 |
| 7· උඳුන් තෙල් | | | | |
| තප්පර 500 .. | 1·28 | 1·88 | — | 4·00 |
| තප්පර 800 .. | 1·23 | 1·83 | — | 3·90 |
| තප්පර 1000 .. | 1·18 | 1·78 | 3·80 | — |

ඉහළ නගිමින් පවතින ඉන්ධන පිරිවැයෙහි මෙන්ම උපකරණ හා අමතර කොටස්වල පිරිවැයෙහි ද එකගතාවයක් පවත්වා ගැනීම උදෙසා ලංකා ගමනාගමන මණ්ඩලය, තම ගාස්තු 1974 පෙබරවාරි මස 04 දින සිට වැඩි කළේය. පළමු ගමනාන්තය සඳහා අවම ගාස්තුව ශත 10 සිට ශත 20 දක්වා වැඩිකරන ලදී. ඊලඟ අදියර දෙක සඳහා, අදියරයකට ශත 05 බැගින් වන පරිදි වැඩි කල අතර, ඉන් ඔබ්බට සෑම අදියරයක් සඳහාම ශත 10 බැගින් වන පරිදි වැඩි කරන ලදී. දුම්රිය දෙපාර්තමේන්තුව තම ගාස්තු වැඩි කලේ සියයට 50 ක් පමණ වූ අධි ගාස්තුවක් මගිනි. තවද, පාර්සල් සඳහා දුම්රිය ගාස්තු ද සියයට 25 කින් වැඩිකරන ලදී.

### (ආ) කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් බාහිර මිළ ගණන්

කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් දැක්වුනු ශීර්ෂයන්ගේ මිළ ගණන්වලට අමතරව මහ බැංකුව විසින් සීමිත භාණ්ඩ සංඛ්‍යාවක මිළ ගණන් එකතු කරනු ලැබේ. මේ තොරතුරු ලබාගන්නේ, කොළඹ නගරයේ සිල්ලර වෙළඳුන් වෙතින් කෙළින්ම විමසීමෙන් හෝ ඒ ඒ ආයතනයන් විසින් පලකර ඇති වෙළෙඳ මිළ ලැයිස්තුවලින් හෝ උපුටා ගැනීමෙනි. එවැනි තෝරාගත් භාණ්ඩ කීපයක 1974 මිළ ගණන්වල වෙනස්වීම් II (එ) 4 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ. එක් එක් වර්ගයේ මිළ වෙනස්වීම් පිළිබඳව අවබෝධයක් ලබාදීම සඳහා මෙකී ශීර්ෂයන් පාරිභෝගික, අන්තර් සහ ආයෝජන භාණ්ඩ යනුවෙන් වර්ග කරනු ලැබේ.

## II (එ) 4 සංඛ්‍යා සටහන

## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් බාහිර මිල*

| ද්‍රව්‍යයේ ස්වභාවය | ප්‍රතිශත වෙනස 1974/73 |
|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | |
| | ල. පෙ. |
| තම්බාපු සහල් | + 21 |
| ටින් කළ මාළු | + 58 සිට 134 |
| ජෑම්, ජල්ලි, සෝස් සහ කෝඩියල් | + 29 සිට 35 |
| දන්තාලේප | + 7 සිට 11 |
| වැල්කම් පූයර | + 14 සිට 32 |
| ඕඩිකොලෝන් | − 29 සිට 1 |
| කමිස | + 87 |
| ඉටිපන්දම් | + 6 සිට 24 |
| මිශ්‍ර සම් භාණ්ඩ | + 38 සිට 42 |
| විදුලි පන්දම් සහ ට්‍රාන්සිස්ටර් බැටරි | + 56 සිට 80 |
| විදුලි පංකා | + 33 සිට 52 |
| මහන මැසින් | + 13 සිට 21 |
| විදුලි බුබුළු | + 61 සිට 100 |
| විදුලි සවි කිරීම (ප්‍රධාන වශයෙන් කේබල් කම්බි) | + 1 සිට 42 |
| මෝටර් රථ අමතර කොටස් | + 5 |
| කාර් බැටරි | |
| **අන්තර් භාණ්ඩ** | |
| කඩදාසි | + 30 සිට 41 |
| පැට්‍රල් | + 91 සිට 105 |
| තඹ කම්බි | + 38 සිට 105 |
| කෝස්ටික් සෝඩා | + 97 |
| පොහොර | + 61 සිට 110 |
| **ආයෝජන භාණ්ඩ** | |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | |
| 1. සිටුවනය සහිත මූහුණ සෝදන බේසම (22"X15") (මෙරට) | + 26 |
| පාදස්ථල රහිත මූහුණ සෝදන බේසම ( එම ) (එම) | + 25 |
| 2. පහත් වැසිකිළි බඳුන් —මෙරට | + 18 |
| 3. මැටි පයිප්ප (2"X4") | + 32 |
| උදළු තල | + 30 සිට 31 |
| ලංකා ලෝහ පොරෝ | + 18 |
| මෘදු වාෂන් | + 68 සිට 83 |
| සරනේරු | + 27 සිට 50 |
| මෝටීස් දොර අගුළු | + 48 |
| ඕෂවෝ කේබල් | + 37 සිට 70 |
| ප්ලැව වුවින් | + 61 සිට 100 |
| රබර් නිෂ්පාදන යන්ත්‍ර | + 18 සිට 42 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* ඒ ඒ භාණ්ඩයන් ඉදිරියෙන් දක්වා ඇති ප්‍රතිශත වෙනස්වීම් අන්තරයෙන් නියෝජනය කැරෙන ශීර්ෂයන්ගේ අඩුම හා ඉහළම ප්‍රතිශත වෙනස්වීම් දක්වයි.

පාරිභෝගික භාණ්ඩ ගණයෙහි මිල වෙනස්වීම් මගින් සාමාන්‍යයෙන් 1973 වසරට වඩා 1974 වසරේ මිල වැඩිවීමේ අනුපාතයන්ගේ සැලකිය යුතු අධික බවක් පෙන්නුම් කරයි. නිදසුනක් වශයෙන්, ජෑම්, ජල්ලි, සෝස් සහ කෝඩියල් සඳහා 1973 මිල වැඩිවීම් සියයට 7 සිට 51 දක්වා විචලනය වූ අතර, 1974 එම වැඩිවීම්වල විචලන ගණන් සියයට 58 සිට 134 දක්වා විය. අන්තර් භාණ්ඩ සඳහා 1974 වර්ෂයේ මිල වැඩිවීම් ඉකුත් වර්ෂයට වඩා බොහෝ දුරට තියුණු ලෙස වැඩි විය. මේ අනුව, 1973 මෙම ගණයේ ශීර්ෂයන් සඳහා සටහන් වූ අඩුම මිල වැඩිවීම කෝස්ටික් සෝඩා සඳහා සියයට 4 වූ අතර, 1974 දී අඩුම මිල වැඩිවීම වූයේ කඩදාසි සඳහා වන සියයට 30 වේ. 1973 ට වඩා 1974 දී මිල වැඩිවීම් සියයට සියයක් ඉක්ම වූ අවස්ථා කීපයක් විය. ආයෝජන භාණ්ඩ සඳහා 1974 වර්ෂය තුළ පැවතියාවූ මිලවල ඉහළ නගින සවභාවය, 4 වන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. මෑදු වානේ, දෙර අගුලු ඔටෝ කේබල්, ජ්ලැව් ටුවින් කේබල් හා රබර් නිෂ්පාදන යන්ත්‍ර වැනි ශීර්ෂයන් සඳහා සැලකිය යුතු මිල වැඩිවීම් සටහන් වී ඇත.

කාර්මික ආයතන බොහොමයක්ම ඔවුන්ගේ නිෂ්පාදිතවල මිල ඉහළ නැංවීමට හේතුවූ කරුණු කෙටියෙන් දක්වා ඇත. බොහෝවිට ඉදිරිපත් කළ කරුණුවලින් සමහරක් නම්, අමු ද්‍රව්‍ය පිරිවැය වැඩිවීම, වැටුප්, ඉන්ධන පිරිවැය, ආනයන මිළ, ව්‍යාපාර පිරිවැටුම් බදු හා අනෙකුත් නිෂ්පාදන නොවන වියදම් වැඩිවීමය. මෙම කාර්මික ආයතන ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය දත්තයන් නොසපයන හේතුවෙන්, එක් අතකින් විවිධ භාණ්ඩයන්ගේ නිෂ්පාදන පිරිවැය කෙරේ අමු ද්‍රව්‍යවල මිළ වැඩිවීමේ බලපෑම ද අනෙක් අතට ඒවායේ මිළද නියත වශයෙන් මිණිය නො හැකිය.

(ඈ) දේශීය වශයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩයන්ගේ තොග මිළ

මහ බැංකුව විසින් වාර්ෂිකව ක්‍රමානුකූල පදනමක් යටතේ මෙරට නිෂ්පාදිත භාණ්ඩයන්ගේ තොග මිළ ගණන් එකතු කරනු ලැබේ. මෙම මිළ ගණන් එකතු කරනු ලබන්නේ නිෂ්පාදකයින්ගෙන්ම හෝ ඔවුන්ගේ ඒජන්තවරුන්ගෙනි. 1973, 1974 කාලය සඳහා මිළ වෙනස්වීම් සකස් කරන ලද නියෝජ්‍යාත්මක ශීර්ෂයන් කීපයක් II (එ)15 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

නිෂ්පාදකයින් සහ ඔවුන්ගේ ඒජන්තවරුන් 1974 වසරේ මිළ ගණන් වැඩිවීම සඳහා හේතු වූ කරුණු ද දක්වා ඇත. බොහෝ අවස්ථාවන්හි මිළ වැඩිවීම්වලට හේතු වූ කරුණුවලින් සමහරක් ලෙස ඔවුන් දක් වූයේ, ආහාර, බීම වර්ග, කෝස්ටික් සෝඩා සඳහා ඉන්ධන මිළ වැඩිවීමද, ආහාර සහ බීම වර්ග සඳහා සීනි මිළ වැඩිවීම ද, ආහාර, බීම වර්ග කෝස්ටික් සෝඩා, වානේ, කේබල්, මහන මැෂින් හා සිමෙන්ති සඳහා අමු ද්‍රව්‍ය පිරිවැය ද, කෝස්ටික් සෝඩා සඳහා වැටුප් පිරිවැය ද සහ යන්ත්‍ර සූත්‍ර, යන්ත්‍රෝපකරණ හා ගෘහ භාණ්ඩ සඳහා ව්‍යාපාර පිරිවැටුම් බදු වැඩිවීමත්ය.

II (එ) 5 සංඛ්‍යා සටහන

## තෝරා ගන්නා ලද දේශීය නිෂ්පාදිත භාණ්ඩවල තොග මිල ගණන්

| | ඒකක | 1973 කම්හල් මිල රු. ශ. | 1974 කම්හල් මිල රු. ශ. | වෙනසේ සියයට ගණන 1974/73 |
|---|---|---|---|---|
| **1. ආහාර ද්‍රව්‍ය, බීම වර්ග සහ දුම්කොළ** | | | | |
| බිස්කට් (ක්‍රීම් ක්‍රැකර්ස්) .. .. | ටින් 1 ක් | 7.67 | 9.18 | + 20 |
| පිටිකිරි (ලක්ස්ප්‍රේ) .. .. | රා. 1 ටින් | 3.99 | 4.50 | + 13 |
| උකුකිරි .. .. | අවු. 14 ටින් | 1.65 | 1.65 | — |
| බටර් .. .. | රා. 1 ක් | 5.40 | 5.40 | — |
| සිසිල් බීම (පෝවෙලෝ) .. .. .. | බෝතල් 1 ක් | 0.42 | 0.88 | +110 |
| සිසිල් බීම (සෝඩා) .. .. .. | ,, | 0.22 | 0.30 | + 36 |
| කෝඩියල් (පැශොනා) .. .. .. | ,, | 5.60 | 11.95 | +113 |
| කෝඩියල් (ඔරෙන්ජ්) .. .. | ,, | 6.00 | 11.95 | + 99 |
| දුම් කොල (අයිලන්ඩ් ප්‍රයිඩ්) .. .. | රා. 1 ක් | 56.45 | 56.45 | — |
| සිගරට් (ත්‍රිරෝසස්) .. .. .. | දහසක් | 139.55 | 139.55 | — |
| **2. රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්** | | | | |
| රෙදි (එල්.ඩී.එම්.) සුදු .. .. .. | යාරයක් | 2.85 | 3.15 | + 11 |
| රෙදි (එල්.ඩී.එම්.) වර්ණවත් .. .. | ,, | 3.35 | 3.55 | + 6 |
| පොප්ලින් – සුදු .. .. .. | ,, | 3.65 | 3.85 | + 5 |
| වොයිල් – සුදු .. .. .. | ,, | 2.90 | 3.10 | + 7 |
| නොපිරූ නූල් – 30 ගණන් පට .. .. | රා. 1 ක් | 7.20 | 8.70 | + 21 |
| පැබරික් සාරි (මුද්‍රිත ෆෙදර් ජෝජට්) 44"/45" .. | යාරයක් | 9.33 | 11.55 | + 24 |
| කමිස රෙදි (ටෙට්රොලීන් පොලිස්ටර්) 35"/36" .. | ,, | 15.00 | 16.00 | + 7 |
| පැබරික් ඇඳුම් (නයිලෝන් සැටින්) 35"/36" .. | ,, | 9.00 | 10.15 | + 13 |
| සාරි (සී සිල්ක්) 44"/45" .. .. | ,, | 10.46 | 10.46 | — |
| කමිස රෙදි (සී සිල්ක් සිල්ව ලයින්) 35"/36" .. | ,, | 11.50 | 11.50 | — |
| ඇඳුම් කට්ටල රෙදි (සී සිල්ක්) 27"/28" .. | ,, | 22.33 | 23.50 | + 5 |
| **3. ඖෂධ සහ පවිත්‍රතා භාණ්ඩ** | | | | |
| බිකැඩෙක්ස් පෙති (මල්ටි විටමින්) .. .. | දහසක් | 47.05 | 47.05 | — |
| සී. බී. පෙති (විටමින් සී සහ බී මිශ්‍ර පෙති) .. | ,, | 62.70 | 62.70 | — |
| ටෙරමයිසින් කෝෂ .. .. .. | බෝ1(කෝ100) | 69.50 | 85.16 | + 23 |
| ඔබරොන් කෝෂ .. .. .. | බෝ1(කෝ30) | 6.61 | 6.61 | — |
| ඩියුරෙල් .. .. .. | බෝ 1 (අවු. 6) | 4.05 | 4.05 | — |
| වෝටබරිස් විටමින් ටොනික් .. .. | බෝ 1 (අවු. 6) | 3.47 | 4.24 | + 22 |
| පෙනිසිලින් 'වී' ඩියුමෙක්ස් .. .. | බෝ 1(පෙ. 500) | 64.00 | 69.33 | + 8 |
| කෝස්ටික් සෝඩා .. .. .. | ටොන් 1 ක් | 2,038.40 | 3567.00 | + 75 |
| ක්ලෝරීන් දියර .. .. .. | | 2,755.20 | 3384.00 | + 23 |
| කැල්සියම් ක්ලෝරයිඩ් .. .. .. | ,, | 1,500.00 | 1500.00 | — |
| **4. ගෘහ භාණ්ඩ සහ ගෙවල සවිකරන භාණ්ඩ** | | | | |
| කාර්යාල අල්මාරි (වානේ) .. .. | 1 | 575.00 | 1090.00 | + 90 |
| ලිපිගොනු අල්මාරි (වානේ) .. .. | 1 | 590.00 | 1135.00 | + 92 |
| රබර් මිශ්‍ර කොහු මෙට්ට (72"/36" සම්මත ප්‍රමාණය) .. | 1 | 140.25 | 205.00 | + 46 |
| රබර් මිශ්‍ර කොහු මෙට්ට (72"/48" විශේෂ) .. | 1 | 182.75 | 290.00 | + 59 |
| රබර් මිශ්‍ර කොහු මෙට්ට (72"/60" අති විශේෂ) .. | 1 | 289.00 | 390.00 | + 35 |
| **5. ලෝහභාණ්ඩ සහ විදුලි උපකරණ** | | | | |
| වානේ – මෘදු වානේ රවුම් ¼" .. | මෙට්‍රික් ටො. 1 | 2,470.00 | 4050.00 | + 64 |
| වානේ – මෘදු වානේ සමකෝණ 1x1x⅛" .. | —එම— | 2,535.00 | 4115.00 | + 62 |
| කලු බැඳුම් කම්බි (මි. මී. 5.6) .. | —එම— | 2,790.00 | 5360.00 | + 92 |
| කටු කම්බි .. | රාත්. 56 | 80.50 | 132.00 | + 64 |
| ලංකා ලෝහ උදළු තල .. | 1 | 17.05 | 17.60 | + 3 |
| ලංකා ලෝහ පොරෝතල (සෘජු) .. | 1 | 21.69 | 30.55 | + 41 |
| කම්බි ඇණ (මි. මී. 5.6) .. | මෙට්‍රික් ටො. 1 | 2,695.00 | 4770.00 | + 77 |
| පරිවාන හා වැස්මසහිත පී. වී. සී. කේබල් 1/044 .. | යාර 100 | 36.60 | 70.00 | + 91 |
| මෝටෝ කේබල් 35/012 .. | අඩි 100 | 26.85 | 42.00 | + 56 |
| සාමාන්‍ය විදුලි සේවා ලාම්පු (වො. 25) .. | 1 | 2.39 | 2.87 | + 20 |
| විශේෂ ලාම්පු (වො. 15) .. | 1 | 2.48 | 2.97 | + 20 |
| තද ආලෝක බල්බ (වො. 60) . | 1 | 2.65 | 3.24 | + 22 |

II (එ) 5 සංඛ්‍යා සටහන (සම්බන්ධය)

## තෝරා ගන්නා ලද දේශීය නිෂ්පාදිත භාණ්ඩවල තොග මිල ගණන්

| | ඒකක | 1973 කම්හල් මිල රු. ශ. | 1974 කම්හල් මිල රු. ශ. | වෙනසේ සියයට ගණන 1974/73 |
|---|---|---|---|---|
| **6· කාර්මික, වාණිජ හා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ මෙවලම් ටයර් හා ටියුබ** | | | | |
| බයිසිකල් ටයර් 28"×1½" (ලෝඩස්) .. .. | 1 | 9·00 | 11·30 | + 26 |
| බර වැඩ ටයර් 28"×1⅜" .. .. | 1 | 10·75 | 13·55 | + 26 |
| මූට්ටු රහිත ටියුබ 26"×1⅜" .. .. | 1 | 3·95 | 5·30 | + 34 |
| මහන මැෂින් (109 වර්ගය/සිංගර්) .. .. | 1 | 717 00 | 926·20 | + 29 |
| මහන මැෂින් (149 වර්ගය/එම) .. .. | 1 | 1024·00 | 1289·17 | + 26 |
| සෙන්ට්‍රිෆියුගල් පිස්ටන් පොම්ප ¾" (පී බී /1 ) .. | 1 | 1211·00 | 2041·50 | + 69 |
| එම කර්මාන්ත පොම්ප 1¼" (140/1 ) .. | 1 | 1609·00 | 1845·00 | + 15 |
| එම කෘෂිකාර්මික පොම්ප 2" (ඊකේජේ) .. .. | 1 | 1706·00 | 3386·50 | + 99 |
| විදුලි පංකා (මේස) පොපියුලර් 36" ඩබ්/එල් .. | 1 | 531·75 | 718 00 | + 35 |
| එම (සිටුවනය සහිත) 16" .. .. | 1 | 604 00 | 832·75 | + 38 |
| **7· කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය** | | | | |
| විශේෂ එළවළු පොහොර (නො. 1) .. .. | ටොන් 1 ක් | 524·16 | 900·92 | + 72 |
| විශේෂ වී පොහොර මිශ්‍රණය .. .. | එම | 642·16 | 939·18 | + 46 |
| මියුරියෙට් ඔෆ් පොටෑෂ් (60%) .. .. | එම | 728·33 | 850·17 | + 17 |
| යූරියා .. .. .. | එම | 865·00 | 1540·00 | + 78 |
| ඇමෝනියා සල්ෆේට් .. .. | එම | 572·50 | 767·17 | + 34 |
| සුපර් පොස්පේට් .. .. | එම | 420·83 | 532·00 | + 26 |
| ඇග්‍රෝ රසායන ද්‍රව්‍ය (මැලතියින් 50% ඊ. සී) .. | අ. 16 බෝතල් | 6·80 | 6·80 | — |
| ට්‍රිතියන් .. .. | එම | 11·50 | 11·50 | — |
| **8· දැව සහ ගොඩනැගිලි ද්‍රව්‍ය** | | | | |
| රැලි තහඩු .. .. .. | වර්ග අඩියක් | 1·14 | 1·23 | + 8 |
| පැතලි තහඩු .. .. .. | එම | 0·77 | 0·88 | + 14 |
| සිමෙන්ති (කන්කසන්තුරේ) .. .. | හො. 1 ක් | 12·00 | 14·50 | + 21 |
| සිමෙන්ති (රුහුණු) .. .. .. | 1 | 13·00 | 14·67 | + 13 |
| සිමෙන්ති (පුත්තලම) .. .. .. | 1 | 12·50 | 14·58 | + 17 |
| **9· විවිධ** | | | | |
| විදුලි පන්දම් බැටරි .. .. .. | 1 | 0 83 | 1·21 | + 46 |
| ට්‍රාන්සිස්ටර් බැටරි .. .. .. | 1 | 0·93 | 1·31 | + 41 |
| ඉවන් විදුලි බැටරි .. .. .. | 1 | 33·50 | 35·70 | + 7 |
| ඔටෝ මෝටර් බැටරි 6 වී. 60 ඇම්ප් .. .. | 1 | 150·00 | 150·00 | — |
| එම ,, 12 වී. 60 ඇම්ප් .. .. | 1 | 245·00 | 245·00 | — |
| රීම් පැකට් ලියන කඩදාසි ( ක්‍රීම්ලෙයිඩ) .. .. | 500 ක් | 43·20 | 52·50 | + 22 |
| යතුරු ලියන කාබන් 8"×10" .. .. | පෙට්ටි 1 ක් | 16·00 | 17·90 | + 12 |
| බීම් පොලිෂ් (රොනුක්ස්) .. .. | රා. 1 ටින් 1 ක් | 5·65 | 6·95 | + 23 |
| කාර් වැක්ස් .. .. | රා. ½ ටින් 1 ක් (ග්‍රොස් 50) | 6·80 | 8·00 | + 18 |
| ගිනි පෙට්ටි .. .. | පෙට්ටි 1 ක් | 349·08 | 454·50 | + 30 |
| තීන්ත වර්ග (ස්නෝෂම්) .. .. | හොණ්ඩර 1 ක් | 180·00 | 200·00 | + 11 |
| එම (පර්මෙෂම්) .. .. | , , | 128·00 | 144·00 | + 13 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**මිළ පාලන සහ සලාක කිරීම්**

පසුගිය වර්ෂ කීපය තුළ රජයේ ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති මාලාවේ මිළ පාලන සහ සලාක කිරීම් අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වී ඇත. උද්ධමනය මැඩලීම හා අත්‍යවශ්‍ය භාණ්ඩයන්ගේ සාධාරණ ලෙස බෙදහැරීම සහතික කිරීමෙලා, මෙකී ක්‍රියා මාර්ගයන්ගේ සාර්ථකත්වය නිශ්චිත වශයෙන් කිව නොහැක. මෙම කොටසෙන් අදහස් කෙරෙනුයේ, මිළ පාලන හා සලාක කිරීම් මගින් 1974 සාමාන්‍ය මිළ මට්ටම කෙරෙහි බලපෑ නව වර්ධනයන් පැහැදිලි කර දක්වීමයි.

වසර ගණනක් තිස්සේ, භාණ්ඩ සමහරක්, මිළ පාලනයට යටත් කරන ලදී. 1974 දී එම ලැයිස්තුවට ඇතුලත් කල අලුත් ශීර්ෂ කීපයක් නම්, බයිසිකල්, ළදරු කිරි බෝතල්, ලාම්පු මැන්ටල්, කැළණි ටයර්, හා ටියුබ්, විටාමෝල්ට් සහ රාත්තල් 7 ක් අඩංගු සිමෙන්ති පැකට් ද වේ. තවද ඒ සමගම භාණ්ඩ කීපයක්ම, මිළ පාලන භාණ්ඩ ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී. කුඩ, උදලු තල, පරිප්පු සහ සස්ටජන් ඒවා වෙති.

1974 දී පාලන මිළයන් සැලකිය යුතු පරිමාණයකින් ප්‍රතිශෝධනය කිරීමට සිදු විය. ඉන් බහුතර කොටස වූයේ, ඉහළ මිළක් කරා කල ප්‍රතිශෝධනයන් ය. එවැනි මිළ ප්‍රතිශෝධන-යන් කර ඇති භාණ්ඩවල නියැදියක් II (ඒ) 6 සංඛ්‍යා සටහනින් පෙන්වනු ලැබේ. මේ අනුව විවිධ ගණයේ අභ්‍යාස පොත්වල පාලන මිළ සියයට 40 කින් පමණ වැඩිකර ඇති බව පෙන්නුම් කෙරේ. වීදුරු තහඩු සඳහා ප්‍රතිශෝධනය කල පාලන මිළෙහි වැඩිවීම සියයට 15 සිට සියයට 50 දක්වා වූ පරතරයක විය. පළමුව, විවිධ ලක්ස්ප්‍රේ නිෂ්පාදිතවල පාලන මිළ ගණන් සැලකිය යුතු පරිදි ඉහළ නංවන ලදී. අනතුරුව, ඒවායේ පාලන මිළ ගණන් මධ්‍යස්ථ ප්‍රමාණයකට අඩු කරන ලදී. කැළණි ටයර් සහ ටියුබ් සඳහා පාලන මිළ සියයට 20-30 ප්‍රමාණයකින් වැඩිකරන ලදී. විවිධ ශ්‍රේණිවලට අයත් ඇස්බැස්ටස් තහඩුවල පාලන මිළෙහි වැඩිවීම සියයට 11 ට වඩා වේ.

1974 වසරේ දී අත්‍යවශ්‍ය භාණ්ඩයන් සඳහා සලාක ක්‍රමයේ වෙනස්වීම් කීපයක් දක්නට විය. වසර මුලදී, එනම් 1974·03·01 දින සිට මසකට, එක් අයකුට දෙනු ලබන සීනි සලාකය රාත්තල් ½ සිට රාත්තල් 1 දක්වා වැඩි කරන ලදී. වසර අවසාන භාගයේදී, එනම් 1974·10·01 දින සිට එය රාත්තල් ½ දක්වා නැවතත් අඩු කරනු ලැබීය. මෙසේ කිරීම අත්‍යවශ්‍ය වූයේ, ලෝක වෙළෙඳ පොළේ සීනි හිඟකමත් හා එහි ප්‍රතිඵලයක් වශයෙන්, කලින් නොසිතූ තරම් මට්ටමකට මිළ ඉහළ යාමත් නිසාය. 1974 වසර අවසානයේ පමණ, කොළඹ සහ තදසන්න ප්‍රදේශවල එක් අයකුට, සතියකට දෙනු ලබන පිටි සලාකය රාත්තල් 1½ දක්වා වැඩි කරන ලදී. ළදරු කිරි ආහාර ගැන සලකා බලන විටදී, කොළඹ නගරයට පමණක් වූ සලාක ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය.

## II (එ) 6 වන සංඛ්‍යා සටහන

### මිළ පාලන ප්‍රතිශෝධනය කිරීම

| ශීර්ෂය | දිනය | කලින් පැවති මිළ | අලුත් මිළ | වෙනසේ සියයට ගණන | දිනය | අලුත් මිළ | වෙනසේ සියයට ගණන |
|---|---|---|---|---|---|---|---|
| ලාම්පු මැන්ටල් | | | | | | | |
| "ලොක්ෂන් වර්ගය" .. | 25·01·74 | — | 8·25 | — | | | |
| "ලිටෙක්ස් වර්ගය" .. | 28·03·74 | — | ·50 | — | | | |
| අඟල් 22 සම්මත ප්‍රමාණයේ | | | | | | | |
| බයිසිකල් .. .. | 23·12·74 | 500·00 | 595·00 | + 19·0 | | | |
| සස්ටපන් .. .. | 29·04·74 | — | 19·45 | — | | | |
| අභ්‍යාස පොත් | | | | | | | |
| පිටු 40 .. .. | 13·06·74 | ·25 | ·40 | + 66·0 | | | |
| පිටු 80 .. .. | එම | ·45 | ·75 | + 66·7 | | | |
| ලොනිවර් අභ්‍යාස පොත් | | | | | | | |
| පිටු 80 .. .. | එම | ·75 | ·95 | + 26·7 | | | |
| පිටු 120 .. .. | එම | 1·00 | 1 30 | + 30·0 | | | |
| පිටු 160 .. .. | එම | 1·25 | 1·70 | + 36·0 | | | |
| පිටු 200 .. .. | එම | 1·45 | 2·10 | + 44·8 | | | |
| පිටු 240 .. .. | එම | 1·75 | 2·50 | + 42·9 | | | |
| පිටු 280 .. .. | එම | 2·00 | 2·90 | + 45·0 | | | |
| පිටු 320 .. .. | එම | 2·25 | 3·30 | + 46·7 | | | |
| වීදුරු තහඩු | | | | | | | |
| මි. මි. 2 වර්ග අඩියක් .. | 11·06·74 | 1·00 | 1·50 | + 50·0 | | | |
| ,, 3 ,, .. | එම | 2·00 | 2·98 | + 49·0 | | | |
| ,, 4 ,, .. | එම | 4·40 | 5·28 | + 20·0 | | | |
| ,, 5 ,, .. | එම | 4·90 | 5·65 | + 15·3 | | | |
| ,, 6 ,, .. | එම | — | 6·95 | — | | | |
| ඇස්බැස්ටෙස් තහඩු | | | | | | | |
| අලියා ලකුණ දරණ "මැස්කනයිට්" රැලි තහඩු | 18·07·74 | 1·19 | 1·41 | + 18·5 | | | |
| අලියා ලකුණ දරණ "මැස්කනයිට්" අර්ධ රැලිතහඩු .. | එම | 1·08 | 1·24 | + 14·8 | | | |
| අලියා ලකුණ දරණ "මැස්කනයිට්" කුඩා අංශ තහඩු.. | එම | 1·04 | 1·21 | + 16·3 | | | |
| අලියා ලකුණ දරණ "මැස්කනයිට්" පැතලි තහඩු .. | එම | ·86 | 1·01 | + 17·4 | | | |
| සිංහයා ලකුණ දරණ සම්මත බරැති රැලි තහඩු .. | එම | 1·19 | 1·33 | + 11·8 | | | |
| සිංහයා ලකුණ දරණ සැහැල්ලු බරැති රැලි තහඩු . | එම | ·99 | 1·11 | + 12·1 | | | |
| සිංහයා ලකුණ දරණ පැතලි තහඩු .. | එම | ·86 | ·96 | + 11·6 | | | |
| කොත්තමල්ලි .. .. | 26·07·74 | ·89 | ·95 | + 6 7 | | | |
| පෝමික් අම්ලය | | | | | | | |
| 85 – 90 ක්‍රි ග්‍රෑම් 35 භාජනවල ඇසුරුමක් .. .. | 12 09·74 | 253·70 | 356 10 | + 40·4 | | | |
| 85 – 90 ඉම්පීරියල් ගැලුමක් .. | එම | 36·00 | 54·80 | + 52·2 | | | |
| 85 90 පයින්ට් එකක් .. | එම | 4·50 | 6·85 | + 52 2 | | | |
| කිරි නිෂ්පාදන | | | | | මිළ පහත හෙලනලදී | | |
| ලක්ස්ප්‍රේ රාත්. 1 පැකට් එකක් .. | 16 09 74 | 4·35 | 7·50 | — | 28·10·74 | 5·50 | + 26·4 |
| ලක්ස්ප්‍රේ රාත්. 1 ටින් එකක් .. | එම | 4·75 | 8·00 | — | එම | 6·00 | + 26·3 |
| ලක්ස්ප්‍රේ රාත්. 2½ ටින් එකක් .. | එම | 11·50 | 18·00 | — | එම | 14·00 | + 21·7 |
| අවු. 14 උකුකළ කිරි ටින් එකක් .. | එම | 1·75 | 3·25 | + 85·7 | | | |
| විටාමෝල්ට් රාත්. 1 ටින් එකක් .. | එම | 6·50 | 8·50 | + 30·8 | | | |
| විටාමිල්ක් රාත්. 1 ටින් එකක් .. | එම | 3·90 | 4·20 | + 7·7 | | | |
| විටාමිල්ක් රාත්. 2½ ටින් එකක් .. | එම | 8·75 | 9·75 | + 11·4 | | | |
| ලාම්පු මැන්ටල් | | | | | | | |
| "ලොක්ෂන්" වර්ගය .. | 30·09·74 | 8·25 | 15·25 | + 84·9 | | | |
| "ලිටෙක්ස්" වර්ගය .. | එම | ·50 | ·70 | + 40·0 | | | |
| "රෝයල්" වර්ගය .. | එම | | ·65 | — | | | |
| වයර් හා වියුබ (ආනයනය කළ) | 21,05·74 | — | — | +25–35% (වයර්) | 10·12·74 | | |
| කැලණි වයර් හා වියුබ (මෙරට) .. (ජීප්රථ, මෝටර්රථ, හා ට්‍රක් හා ට්‍රැක්ටර් සඳහා) | 10·12·74 | — | — | +20–33% (වියුබ) | | | |
| සිමෙන්ති | | | | | | | |
| රාත්තල් 7 පැකට් එකක් .. | 06·11·74 | | 22·00 | — | 13·12·74 | | |
| රාත්තල් 110 මලු එකක් .. | 13·12·74 | — | 24·50 | — | එම | | |

## 2. වැටුප්

මහ බැංකුව විසින් රාජ්‍ය අංශයේ කාර්මික හා ලිපිකාර සේවකයන්, සුළු සේවකයන් සහ පාසැල් ගුරුවරුන් සඳහා සකස් කරනු ලබන වැටුප් අනුපාතික දර්ශකයන්, නියෝජිත පරිමාණයන්හි සේවකයන්ට ගෙවිය යුතු අවම වේතන, වැටුප් හා දීමනා මත පදනම්වී ඇත. එහෙයින් අතිකාල හා වැඩිවීම් දීමනා මෙයට ඇතුළත් කර නොමැත. පෞද්ගලික අංශයේ පඩිපාලක සභා, පාලනයට නතුවන කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියුතු සේවකයන් සඳහා වැටුප් අනුපාතික දර්ශකයන්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගණනය කර ප්‍රකාශයට පත්කරනු ලැබේ. වැටුප් පාලක සභා විසින් නියම කෙරුණ අවම වැටුප් අනුපාතික මත මෙකී දර්ශකයන් පදනම් වී ඇති අතර, 1967 දෙසැම්බර් මාසයේ සිට එයට 'අවප්‍රමාණ දීමනාව' ද ඇතුළත් වෙයි. මෙහි සඳහන් වැටුප් අනුපාතික දර්ශකවල රාජ්‍ය අංශයේ අතිකාල දීමනා ඇතුළත් වන නියම ඉපැයුම් සහ පෞද්ගලික අංශයේ සානුබල හෝ අතිකාල දීමනාවලට අමතරව පාරිතෝෂිකයන් වැනි විශේෂ දීමනා නියෝජනය නොකරන බව සැලකිල්ලට ගතයුතු වෙයි. මූර්ත වැටුප් අනුපාතික දර්ශක සකස් කරනු ලබන්නේ කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් නාමික වැටුප් අනුපාතික දර්ශකයන් අවධමනය කිරීමෙනි.

II (එ) 7 වන සංඛ්‍යා සටහනින්, 1973 සහ 1974 වර්ෂයන් සඳහා රජයේ සේවකයන්ගේ වාර්ෂික හා ත්‍රෛමාසික වැටුප් අනුපාතික දර්ශකයන් දක්වෙයි. සාමාන්‍ය වශයෙන් ගත් කල සියලුම ගණවල රජයේ සේවකයන්ගේ නාමික වැටුප් අනුපාතිකයන් 1973 වසරට වඩා 1974 වසරේදී වැඩිවී ඇත. මධ්‍යම රජයේ සේවකයන් සඳහා වන වැටුප් අනුපාතික 1973 වසරට වඩා සියයට 12 6 කින් වැඩිවිය. සුළු සේවකයන් සඳහා වන නාමික වැටුප්වල වැඩිවීම සියයට 13·5 කින් යුතු වූ අතර, කාර්මික හා ලිපිකාර සේවකයන් සඳහා එහි වැඩිවීම සියයට 11·3 කට ආසන්න විය. රජයේ පාසැල් ගුරුවරුන්ගේ නාමික වැටුප්ද සියයට 10 ට වඩා ප්‍රමාණයකින් වැඩි විය.

### II (එ) 7 සංඛ්‍යා සටහන
### රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතික දර්ශකාංක
### (1952 = 100)

| | කාර්මික හා ලිපිකාර සේවකයෝ | | සුළු සේවකයෝ | | මධ්‍යම රජයේ සේවකයෝ (අ) | | රජයේ පාසැල් ගුරුවරු | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| **1973** | | | | | | | | |
| සාමාන්‍යය .. | **163·0** | **98·6** | **194·2** | **117·5** | **180·1** | **108·8** | **144·3** | **87·3** |
| පළමු කාර්තුව .. | 160·2 | 101·6 | 189·9 | 120·4 | 176·5 | 111·9 | 142·4 | 90·3 |
| දෙවන කාර්තුව .. | 160·2 | 99·3 | 189·9 | 117·7 | 176·5 | 108·7 | 142·4 | 88·3 |
| තුන්වන කාර්තුව .. | 160·2 | 95·5 | 189·9 | 113·2 | 176·5 | 105·2 | 142·4 | 84·9 |
| සතරවන කාර්තුව .. | 171·3 | 98·0 | 207·2 | 118·6 | 190·9 | 109·3 | 149·8 | 85·7 |
| **1974** | | | | | | | | |
| සාමාන්‍යය .. | **181·4** | **97·7** | **220·5** | **118·7** | **202·8** | **109·2** | **159·1** | **85·7** |
| පළමු කාර්තුව .. | 171·3 | 96·1 | 207·2 | 116·2 | 190·9 | 107·1 | 149·8 | 84·0 |
| දෙවන කාර්තුව .. | 184·8 | 101·1 | 224·9 | 123·1 | 206·8 | 113·2 | 162·2 | 88·8 |
| තුන්වන කාර්තුව .. | 184·8 | 98·0 | 224·9 | 119·3 | 206·8 | 109·7 | 162·2 | 86·0 |
| සතරවන කාර්තුව .. | 184·8 | 95·6 | 224·9 | 116·3 | 206·8 | 106·9 | 162·2 | 83·9 |
| 1973 ට වඩා 1974 ප්‍රතිශත වෙනස | + 11·3 | − 0·9 | +13·5 | + 1·0 | +12·6 | + 0·4 | +10·3 | − 1·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ලිපිකාර හා කාර්මික සහ සුළු සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

සංලක්ෂ්‍යය: 1959 සැප්තැම්බර් 30 වැනිදට සේවයෙහි යෙදී සිටි සේවක සංඛ්‍යාවන් මත පදනම්වූ නිශ්චිත බර තැබීම් මත මෙම දර්ශකාංකයන් ගණනය කර ඇත. දර්ශකාංකයන් ගණනය කිරීමේදී යොදාගෙන ඇති වැටුප් අනුපාතිකයන් වනුයේ, එක් එක් නියෝජන පරිමාණයෙහි වූ මූලික වැටුප් සහ දීමනාවන්ය.

II (එ) 8 වන සංඛ්‍යා සටහනින් වැටුප් පාලක සභා යටතට ගැනෙන වෘත්තීන්හි නියුතු සේවකයන් සඳහා වූ වැටුප් අනුපාතික දර්ශක පෙන්වයි. 1974 වසරේදී වැටුප් පාලක සභා යටතට ගැනෙන වෘත්තීන්හි නියුතු සේවකයන්ගේ නාමික වැටුප් සැලකිය යුතු පරිදි වැඩිවී ඇති බව නිරීක්ෂණය වේ. නිදසුනක් වශයෙන් කෘෂිකාර්මික කටයුතුවල නියුතු සේවකයන් සඳහා සාමාන්‍ය අවම වැටුප් අනුපාතික දර්ශකය, 1973 දී 168·1 ක්ව පැවැති අතර, එය ආසන්න වශයෙන් සියයට 25 ක වැඩිවීමක් වාර්තා කරමින් 1974 දී 210·0 දක්වා ඉහළ ගොස් තිබේ. ඉකුත් වර්ෂය හා සැසඳිමේදී කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියුතු සේවකයන් සඳහා වැටුප් වැඩිවීම, දළ වශයෙන් සියයට 18 ට වඩා වැඩිවී ඇත.

## II (එ) 8 සංඛ්‍යා සටහන

### වැටුප් පාලක සභා කර්මාන්තයන්හි සේවකයන් සඳහා අවම වැටුප් අනුපාතික දර්ශකාංක. (1952 = 100)

| | කෘෂිකර්මාන්තයෙහි නියුතු සේවකයෝ (අ) | | කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියුතු සේවකයෝ (ආ) | | පඩි පාලක සභාවලට නතුවන කර්මාන්තයන්හි නියුතු සේවකයෝ (ඇ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| 1973 සාමාන්‍යය .. | 168·1 | 101·5 | 199·7 | 120·7 | 169·9 | 102·7 |
| පළමු කාර්තුව .. | 158·8 | 100·7 | 191·7 | 121·5 | 162·1 | 102·8 |
| දෙවන කාර්තුව .. | 160·4 | 99·4 | 194·0 | 120·2 | 163·9 | 101·5 |
| තෙවන කාර්තුව .. | 165·7 | 98·7 | 196·0 | 116·8 | 168·6 | 100·5 |
| සතරවන කාර්තුව .. | 187·4 | 107·3 | 217·4 | 124·4 | 184·6 | 105·7 |
| 1974 සාමාන්‍යය .. | 210·0 | 113·0 | 235·8 | 126·9 | 212·5 | 114·3 |
| පළමු කාර්තුව .. | 191·2 | 107·2 | 218·4 | 122·5 | 194·0 | 108·8 |
| දෙවන කාර්තුව .. | 211·7 | 115·9 | 240·0 | 131·3 | 214·4 | 117·3 |
| තෙවන කාර්තුව .. | 215·8 | 114·4 | 241·3 | 128·0 | 218·1 | 115·7 |
| සතරවන කාර්තුව .. | 221·4 | 114·5 | 210·3 | 126·0 | 223·5 | 115·6 |
| 1973 ට වඩා 1974 ප්‍රතිශත වෙනස | + 24 9 | +11·3 | +18·1 | + 5·1 | +25·1 | +11·3 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තේ වගාව හා නිෂ්පාදනය, රබර් වගාව හා නිෂ්පාදනය සහ පොල් වගා කර්මාන්ත පමණක් අඩංගු වේ.

(ආ) පොල් නිෂ්පාදනය, ඉංජිනේරු, මුද්‍රණ කටයුතු, ගිනිපෙට්ටි නිෂ්පාදනය, මෝටර් රථ ප්‍රවාහනය, නැව් තටාක, වරාය, වරාය ප්‍රවාහණ, තේ අපනයන, රබර් අපනයන සිනමා සහ ගොඩනැගිලි කර්මාන්තයන් පමණක් අඩංගු වේ.

(ඇ) කෘෂිකාර්මික සේවකයන් සහ කර්මාන්ත හා වාණිජ සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

නාමික වැටුප් අනුපාතිකයන්ගේ ඉහළ යාමට හේතු වූයේ, 1974 වසර ආරම්භයේ රජය විසින් ප්‍රදනය කළ වැටුප් වැඩිවීම ය. රජය විසින් අප්‍රියෙල් මස 1 වැනි දින සිට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මසකට රුපියල් 400 කට නොවැඩි වේතනයක් ලබන සේවකයන්ට 1973 ඔක්තෝබර් 1 වැනි දින සිට ගෙවන ලද සියයට 10 වැටුප් වැඩිවීම ඉවත්කර ඒ වෙනුවට මසකට රුපියල් 800 හෝ ඊට අඩු වේතනයක් උපයන අය හට සියයට 20 ක ඉහළ වැටුප් වැඩිවීමක් ප්‍රදනය කරන ලදී. රාජ්‍ය අංශයේ මෙම වැටුප් වැඩිවීම වන මසකට රුපියල් 800 හෝ ඊට අඩු වේතනයක් ලබන සියලුම සේවකයන් හට මසකට රුපියල් 50 ක උපරිමයකට යටත්ව ගෙවන ලද සියයට 20 ඉහළ දීමනාව කරණකොට ගෙන 1973 ඔක්තෝබර් 1 වැනි දින ප්‍රදනය කරන ලද විශේෂ දීමනාව ඉවත් කෙරේ. මසකට රුපියල් 800 හෝ ඊට අඩු වැටුපක් ලබන ලංකාවාසී විශ්‍රාමිකයන් හටද එම වැටුප් වැඩිවීම අදළ වනු ඇත. කෙසේ වෙතත්, 1972 ප්‍රදනය කළ රුපියල් 7·50 ක විශේෂ දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ.

1973 ඔක්තෝබර් මස රාජ්‍ය අංශයේ කල වැටුප් වැඩිවීම, පෞද්ගලික අංශය වෙතද දීර්ඝ කරන ලදී. මසකට රුපියල් 400 නොඉක්ම වන, මාසික හා දෛනික වැටුප් උපයන සේවකයන්ගේ වැටුප් ද සියයට 10 කින් ඉහළ නංවන මෙන් රජය විසින් පෞද්ගලික අංශය වෙත නියෝග කරන ලදී. 1973 ඔක්තෝබර් මසදී කළ වැටුප් වැඩිවීම වෙනුවට 1974 අප්‍රේල් මස 1 වැනි දින සිට මසකට රුපියල් 800 නොඉක්මවන සියලුම සේවකයන්ගේ වැටුප් සියයට 20 කින් (රුපියල් 50 ක මාසික උපරිමයකට යටත්ව) වැඩිකරන මෙන් පෞද්ගලික අංශය වෙත නියෝග කරන ලදී. කෙසේ වුවද, මෙම අනුමත කර ඇති අතිරේක වැටුප් වැඩිවීම, කිසියම් සාමූහික ගිවිසුමක් යටතේ ගෙවනු ලබන වරක් පමණක් ගෑනෙන ජීවන වියදම් පාරිතෝෂිකයන්ගෙන් හෝ කොළඹ පාරිභෝගික මිළ දර්ශකය අනුව තීරණය කැරෙන ජීවන වියදම් දීමනා වලින් හෝ අඩුකරගනු ලැබිය හැකිය.

රජයේ සේවකයන් සඳහා වන අවම මූර්ත වැටුප් අනුපාතික දර්ශක ආන්තික වශයෙන් පහත වැටී ඇති බව II (ඒ) 7 වැනි සංඛ්‍යා සටහනේ ඇස්තමේන්තුවලින් පෙනී යයි. අනෙක් අතට, වැටුප් පාලක සභා යටතට ගැනෙන සේවකයන්ගේ මූර්ත වැටුප්, 1973 ට වඩා 1974 දී සැලකිය යුතු පරිදි වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරුණි. මූලික ඇස්තමේන්තුවල දක්නා මෙම අසමානතාවයන් නිසා, නාමික වැටුප් අනුපාතික ගණනය කරන ක්‍රමයේදී හා මූර්ත වැටුප් සෙවීමේදී, නාමික වැටුප් අනුපාතික අවධමනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන ජීවන වියදම් දර්ශකය යන දෙකේම පිළිගත හැකි බව කෙරේ සැලකිය යුතු අන්දමේ සැක පහළ වේ. කෙසේ වෙතත්, නාමික වැටුප් අවධමනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන කොළඹ පාරිභෝගික මිළ දර්ශකය, ජීවන වියදමේ ඉහළයාම් මුළුමණින්ම ඌන තක්සේරු කිරීමේ හේතුව නිසා රජයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල පහත වැටීම, II (ඒ) 7 සටහනේ දී ඇති සංඛ්‍යා ඇස්තමේන්තුවලට වඩා බොහෝ අධික විය යුතු බව නිරීක්ෂණය කළ හැක. එපරිද්දෙන්ම, 1974 ජීවන වියදමේ තියුණු වැඩිවීම් සැලකිල්ලට ගැනීමෙන් පසුව, කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතුවල මූර්ත වැටුප් සැලකිය යුතු අන්දමින් පහත වැටී තිබිය හැකි බව ප්‍රකාශ කළ හැක.